# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 2017 අංක 3 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2017 පෙබරවාරි මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2017 පෙබරවාරි මස 23 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# 2017 අංක 3 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2017 පෙබරවාරි මස 22 වන දින]

එල්.ඩී.—ඕ. 14/2016

## 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

1. මේ පනත 2017 අංක 3 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 2017 ජනවාරි මස 8 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

*2014 අංක 38 දරන පනතට 5අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.*

2. 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනතේ 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ පනතේ "5අ" වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:-

*"2017 ජනවාරි මස 8 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉඩම් බදුකරණ බද්ද අයකර ගනු නොලැබිය යුතු බව.*

5අ. මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් ඉඩමක් -

(අ) විදේශිකයකුට; හෝ

(ආ) සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද, විදේශීය කොටස් හිමිකාරිත්වය සෘජුව හෝ වක්‍රව සියයට පනහක් හෝ ඊට වැඩි සමාගමකට; හෝ

(ඇ) විදේශීය සමාගමකට,

2017 ජනවාරි මස 8 වන දින හෝ එදිනට පසුව එළඹෙන ලද බදු ගිවිසුමක් යටතේ බද්දට දීමේ දී ඉඩම් බදුකරණ බද්දට අදාළ විධිවිධාන අදාළ නොවිය යුතු අතර, ඒ අනුව ඒ දිනයේ දී හෝ එදිනට පසුව

එවැනි යම් තැනැත්තකුගෙන් හෝ සමාගමකින් ඉඩම් බද්දකරණ බද්ද අයකර ගැනීම් හෝ රැස් කිරීම නොකළ යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹින එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.